# ශ්‍රී ලංකාවේ පළමු ලම්බකර්ණ රාජවංශයේ ආරම්භය පිළිබඳව ඓතිහාසික පුරාවිද්‍යා අධ්‍යයනයක්

**ගල්වැවේ විමලඛන්ති හිමි**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය.

**Abstract**

Dynasties of kings in Sri Lanka always describes in chronicles are specially based on the Indian subcontinent emerged dynasty system. According to that method first dynasty of Sri Lanka "The Vijaya raja dynasty" emerged from the sun which we called Soorya Raja dynasty. When the first half of the first century A.D. it collapsed and new dynasty emerged instead of that which called "Lambakarna Raja Dynasty". In this article it is going to investigate the nature of the Lambakarana rase and its development of a dynasty of Sri Lanka. It came to the throne in several times and here the discussion was made to clarify the Lambakarana race and its inheritance to the throne of Sri Lanka. The founder of the race "king Vasabha" is not belong to a certain Khastriya race and also he himself not introduced his race directly through so scholars tried to combind his race to the Great Gautama Buddhas race. Here it is been discussed these facts and trying to have a conclusion through the historical and archaeological facts.

*Key Word :* Dynasties, Lambakarna, Sri Lanka, king Vasabha.

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවෙහි රාජ්‍යවංශ පිළිබඳව විමසීමේදී සූර්යවංශොත්භූත විජයරාජ වංශයත්, ලම්බකර්ණ රාජ වංශයත් කළින් කලට රාජ්‍යත්වයට පත්වනු නිරීක්ෂණය කළ හැකි ය. එම රාජ වංශ මෙරට රාජ්‍යත්වය සඳහා නියම උරුමයක් ලබා තිබුනේ ද යන්න ස්ථාවර කිරීමට ද වංශකථාවන්හි ප්‍රමාණවත් කරුණු දක්වා තිබේ. මෙම පර්යේෂණයෙන් පළමු ලම්බකර්ණ රාජ වංශය පිළිබඳව විමර්ශනය කෙරෙන අතර ඒ තුළින් තත් රාජ වංශයේ පරිපාලන වෙනස්කම් පැවතියේදැ යි පරීක්ෂා කිරීමක් ද සිදු කොට තිබේ.

**අරමුණ**

මෙම පර්යේෂණ ලිපියේ අරමුණ වන්නේ ක්‍රිස්තුවර්ෂෝදයත් සමගම ආරම්භ වූ පළමු ලම්බකර්ණ රාජවංශය පිළිබඳ විමර්ශනය කිරීම යි. මෙහිදී වංශකථාවන්හි පෙණෙන තොරතුරු සනාථ කිරීමට හා අතිරේක තොරතුරු විමර්ශනය කිරීම සඳහා වැඩි වශයෙන් භාවිත කොට ඇත්තේ ශිලා ලේඛනයන් ය. ඒ අනුව ඓතිහාසික පුරාවිද්‍යා මූලාශ්‍රය මගින් පළමු ලම්බකර්ණ රාජවංශය හා එයට මෙරට රාජ්‍ය විචාරීම සඳහා පැහැදිලි උරුමයක් පැවතියේදැ යි විමසීම මෙහි අරමුණ වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙහිදී පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් භාවිත කොට ඇත්තේ ග්‍රන්ථ සන්ධාර පර්යේෂණ ක්‍රමවේදය යි. ක්ෂේත්‍ර පර්යේෂණ ක්‍රමවේදය වැඩි වශයෙන් භාවිත කොට නැති අතර හමුවී ඇති ප්‍රකාශිත ශිලාලේඛනයන් වැඩි වශයෙන් මෙහිදී යොදාගෙන තිබේ. එහෙත් අභිනවයෙන් සොයාගත් උක්ත රාජ්‍ය කාලයට අයත් ශිලාලේඛන ද මෙහිදී භාවිතයට ගෙන තිබේ.

**සාකච්ඡාව**

අපර බ්‍රාහ්මී යුගය ඇරඹෙන්නේ මෙරට රාජ්‍ය පාලන ඉතිහාසයෙහි නව රාජවසංයක ආරම්භය ද සමගිනි. එසේ දැක්වීමට හේතු වන්නේ තත් යුගයේ අභිලේඛනයන්හි වස්තුවිෂය, භාෂාව, ලිඛිත ක්‍රමය මෙන්ම අන්තර්ගතයේ ද විශාල වෙනසක් දක්නට ලැබීමත්, ඒ හා සමගම නව රාජවංශයක ආරම්භය ද ඇතිවීමත් නිසා ය. අපර බ්‍රාහ්මී යුගයේ අභිලේඛනයන්හි ආරම්භයේ ඇති මංගල සූචක වදන ආදියෙහි යම් වෙනසක් මූල බ්‍රාහ්මී යුගයේ අවසානයේ ද දක්නට ලැබුන ද එය වඩාත් වෙනසකට සෘජුව පත්වීම නිරීක්ෂණය කළ හැක්කේ ක්‍රිස්තුවර්ෂාරම්භයත් සමග ය. මෙතෙක් රාජ්‍ය විචාළ මෞර්‍ය රාජවංසය බලයෙන් පහකොට ලම්බකර්ණ නම් නව රාජවංසයක් බලයට පත්වීම මෙම යුගයේ ආරම්භයත් සමගම සිදු වේ. මෙහිදී මෞර්ය රාජවංසයේ අවසාන රජවරුන් හා ලම්බකර්ණ වංසකයින් අතර කළෙක සිට පැවති ගැටුම ද මෙහිදී අවතක්සේරුවට පත්කළ හැකි නොවේ. ලම්කර්ණ වංශිකයන් රාජ්‍ය බලය ලබාගැනීම සඳහා කල්යල් බලමින් සිටි බවට සාධක වංසකථා තොරතුරු ආශ්‍රයෙන් ද ස්ඵුට වේ.

ලම්බකර්ණයන් හා මෞර්‍ය රජවරුන් අතර ආරවුලක් වාර්තා වන්නේ ඉලනාග (ක්‍රි.ව.33-43) රාජ්‍ය කාලයේය. තිසා වැවේ දියනෑම සඳහා ගිය රජු අතහැර ලම්බකර්ණයන් රාජ ගෘහයට පැමිණීම මෙම ආරවුලේ ප්‍රථම අවස්ථාව වශයෙන් මහාවංසය වාර්තා කරයි (ම.ව.36-16-17) මින් කෝපයට පත් ඉලනාගරජ තෙමේ ලම්බකර්ණයන් ලවා මහා ස්ථූපයක් කරවීමට යොදා ඔවුන්ගේ විමර්ශනය සඳහා සැඩොලුන් යෙදීය. (එම.18) මෙය උසස් වංශයකට හා රාජ්‍ය තනතුරු දැරූ ලම්බකර්ණයන්ට කළ මහත් නින්දාවක් හා පලි ගැනීමක් වශයෙන් ඔවුන් සැලකූ බව පෙනේ. මෙහි පෙනෙන අනෙක් වැදගත් ලක්ෂණය වන්නේ ඉලනාගට රාජ්‍ය පාලනය සඳහා නියම උරුමයක් නොවීමයි. ඉගනාග යනු ආමණ්ඩගාමණීඅභය රජුගේ බෑණනුවන්ය. මේ නිසා පරම්පරා උරුමයන් තිබුන ද රාජ්‍ය බලය සඳහා ක්‍රමික උරුමයක් එරජුට නොවූ බව එයින් පසක් වේ. දීපවංසයෙහි ද ඉලනාග රජු ආමණ්ඩගාමණීඅභය රජුගේ බෑණනුවන් බව පිළිගනී. (දී.ව.21-40) එහෙත් ගාථා දෙකකට සීමා වූ එරජු පිළිබඳව පුවත් තුළ ලම්බකර්ණයන් හා පැවති ගැටුම් පිළිබඳ කිසිවක් සටහන් නොවේ.

ලම්බකර්ණයන් මෙම යුගය වන විට බලයෙන් රාජ්‍ය පාලනයෙහි මහත් බලයක් හිමිකරගෙන සිටි බව සනාථ වේ. ඔවුහු රජුගේ ඉහළ තිල දරමින් බලයෙන් ආඪ්‍යව විසූහ. ඒ බව ඔවුන් එක්ව රජු රජ ගෙහිම හිරකොට තබා තුමූම වර්ෂ තුනක් රාජ්‍ය විචාරීම ද සිදුකොට තිබීමෙන් පැහැදිලි වේ. එහෙත් ඔවුන් අතරින් කවරෙක් මහරජු වශයෙන් රජ කළේ දැයි වංසකථාදියෙහි කරුණු සටහන් නොවේ. (ම.ව.35.19/ගුණවර්ධන ආර්..1965:70) පරණවිතාණයන් ලම්බකර්ණයන් ලේඛක පරම්පරාවක් නියෝජනය කරන බව දක්වයි. ඔවුන් බෝධි ආගමනයත් සමග මෙහි පැමිණි දහඅට කුලයේ (18) එක් කුලයක් නියෝජනය කළ බවත් එයින් පෙනේ. (පරණවිතාන එස්. 1963:170) පරණවිතාන මෙම මතයට එළඹෙනුයේ මහාවංශයේ තිස්හත්වෙනි පරිච්ඡේදයේ (37) විසිවෙනි ගාථාව සඳහා (20) නිකාය සංග්‍රහය නොහොත් සාසනාවතාරය ලබාදෙනු ලබන අර්ථවිවරණය පදනම් කරගෙනයි. මහසෙන් රාජ්‍ය අවධිය පිළිබඳ විවරණයක යෙදෙන නිකාය සංග්‍රහය කතුවරයා එහි ''වලලභා හරියා රඤ්ඤො ඤා එකා ලේඛක ධීතිකා" යන්න පරිවර්තනය කොට ඇත්තේ "ඒ රජුගේ අගබිසෝ තනතුර සිටි රාජ වල්ලභ ලැමැණි දුවක්" වශයෙන් ලේඛක ධීතිකා යනු "ලමැණි දුවක්" වශයෙන් ගැනීමෙනි. (නි.සං.1922:14) ඒ අනුව බැලුවහොත් ලම්බකර්ණයන් යනු ලේඛක පරම්පරාවක් බව පැහැදිලි වේ. මේ සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේදී පැහැදිලි වන්නේ ඔවුන් ලේඛක කාර්යයන් සම්බන්ධයෙන් මනා පරිචයක් ඇතිව සිටි බවයි. ඒ තත් අපර බ්‍රාහ්මී යුගයේ ශ්‍රී ලාංකේය ශිලාලේඛනයන්ගේ වස්තු විෂය හා ලේඛන තාක්‍ෂණය හා තලය ද බෙහෙවින් වර්ධිත අවධියෙක් ප්‍රදර්ශනය කරන බැවිනි.

ඉලනාග රජු හා ලම්බකර්ණයන් අතර වූ සටන් පිළබඳ වංසකථා විස්තර මෙම යුගයේ ලම්බකර්ණයන්ගේ බලපරාක්‍රමය කෙබඳුද යි ප්‍රකාශයට පත් කෙරෙන අවස්ථාවක් වශයෙන් රජු රාජද්වාරය තුළම රජු සිරකොට තැබීමෙන් ම පැහැදිලි වේ. මුලින් දැක්වූ ආකාරයට මෙරටට බෝධි ආගමනයත් සමග පැමිණි ඔවුන් රජයේ බලවත් ඇමතිකම් දරමින් කටයුතු කළ බව සඳහන් වේ. මේ අතර ඉලනාග රජු සිය රජගෙහි තුළම සිරකොට තබා තුමූම රාජ්‍ය විචාරීමෙන් ලම්බකර්ණයන් කෙතරම් බලයක් සහිතව සිටියේද යි සනාථ වේ. එහෙත් ඉලනාග රජු ඉන් මිදී දකුණු ඉන්දියාවට පලායාමේ පුවත මහාවංශයෙහි දක්වා ඇත්තේ ඉතා විචිත්‍රවත් කථාවක් සමගිනි.

තම රාජභවනයෙහි ම සිරකරුවෙකු වූ ඉලනාග රජු පිළිබඳ කල්පනාවෙන් සිටි රාජ දේවිය සිය පුතුට රාජ්‍ය බලය අහිමිවන බවත්, ලම්බකර්ණයන්ගේ බලය බෙහෙවින් වැඩි බවත් අවබෝධකරගෙන සිටියාය. මේ නිසා ඇය කල්පනා කළේ සිය බිළිදු කුමරුවා මඟුලැතු ලවා පාගවා මරදැමීම ලම්බකර්ණයන් අතින් මිය යාමට වඩා වැදගත් හා ගෞරවාන්විත වන බවයි. මෙ නිසා ඇය සිය කුළුදුල් සිඟිති පුතු සර්වාභරණයෙන් සරසවා මඟුලැතුගේ පාමුල තබා තම ස්වාමියාට අත්ව ඇති ඉරණමද මඟුලැතුට පවසා පුතු මරාදැමීම සතුරන් අතින් මරණයට පත්වනවාට වඩා යහපත් බව පැවසුවාය. මෙම විස්තරය මඟුලැතුට පවසනුයේ එම ඇතුට ලියූ හසුනක් මඟිනි. (ම.ව.35.20: පරණවිතාන එස් 1964.171) මේ සියල්ල මඟුලැතුට පවසනුයේ රජකුමරුගේ කිරි මව්වරුන් විසිනි. මේ බව වටහාගත් මඟුලැතු රජගේ දොර බිඳ රජු සියපිට මත නඟවාගෙන ගොස් මහාතිත්ථ නම් නැව් තොටට ගෙන ගොස් රජු ඉන්දියාව බලා පිටත් කර හැරියේය. (ම.ව.35.25/26) මංගල හස්ථියාද මලය දේශයට ගිය බව කථාවේ පැහැදිලිව දක්වා තිබේ. (එම:26) එහෙත් මෙහි ඇති අවිශ්වාසනීය තොරතුරු ඉවත් කළ විට පෙනී යන්නේ ඉලනාග රජ සිරගෙයින් පලායාම සඳහා යම් ක්‍රමවේදයක්

භාවිතා කළ බවයි. එසේම ඔහු සිය රටින් ඉන්දියාව බලා පලාගිය බව සැලවීමද මෙහදී වැදගත් වේ. එසේ බලසෙන් රැස් කරගැනීමට ඉන්දියාවට පලායාමට හේතුවීමෙන් පෙනෙනුයේ මේ වන විට ලම්බකර්ණයන් රාජ්‍යයේ උසස් තනතුරු බොහෝමයක බලය සිය අණසකට නතුකරගෙන සිටි බවයි. තවද ඔවුන්ගේ බලපරාක්‍රමය සලකා කාර්‍යයෙහි යෙදුන අන්‍යයන් හා ජනතාවද භාරගෙන සිටි බව වර්ෂ තුනක් ඔවුන් මෙරට පාලනය කිරීමෙන් ද තහවුරු වේ. විවිධ රාජ්‍ය තනතුරු දරූ ලම්බකර්ණයන් එක්ව මහත් බලයක් ගොනගාගෙන සිටි බව මහාවංසයේ තිස්පස්වෙනි පරිච්ඡේදයේ (35) දහඅටවෙනි (18) ගාථාවට අර්ථ සපයන වංසත්ථප්පකාසිනියේ "සබ්බේ හුත්වාන එකතො" යන්නට සියලු ලබණු පිරිස එකට ගෙන" වශයෙන් දක්වා තිබීමෙන් පැහැදිලි වේ. (වංසත්ථප්පකාසිනීඃ අමරවංස හිමි ඒ., දිසානායක එච්. පරිඃ 200/516) කෙසේ වෙතත් ඉලනාග රජු සිරගෙ යින් නිදහස් කරගැනීම සඳහා රහසිගත ව්‍යායාමයක් එළදරූ ක්‍රියාවක නියුක්ත වූ බව මෙම විස්තරවලින් පැහැදිලිව සනාථ වේ. එහෙත් රජුට නැවත රාජ්‍ය බලය ගබාගැනීම සඳහා ඉන්දියාවේ ප්‍රධානියකුගේ අධාර ඇතිව හා රුහුණු රටින් බලසෙන් සංවිධානය කරගැනීම සඳහා වර්ෂ තුනක් තරම් කාලයක් ගතකිරීමට සිදු වූ බවද මෙයින් පැහැදිලි වේ.

වර්ෂ තුනකට පසුව ඉලනාග රජු ලක්දිව සැපත් වන්නේ ඉන්දියාවෙන් ලබාගත් සේනාවක් ද සහිතවයි. මහාවංසයේ විස්තර වෙන්නේ ඉන්දියාවෙන් බලසේනාවක් ගෙන සක්කරසොබ්බයට ගොඩබට බවයි. (ම.ව.35ඃ28) පසුව තවදුරටත් සේනාව සන්නද්ධ කරගැනීම සඳහා රුහුණු රටට වන් බවද එහි විස්තර වේ. කෙසේ වෙතත් රජු ලම්බකර්ණයන් හා සටනට යොමුවන්නේ විදේශීය හා දේශීය වශයෙන් සේනාව තර කරගෙනය. එසේම එම රජ සතුරන් මර්දන පිණිස විදේශාධාර හා සේනාව ලද පළමු රජු වශයෙන් ද ඉතිහාසයට එකතු වෙයි. (පරණවිතාන එම.1964ඃ 171) මෙයින් පෙනී යන්නේ රජු ටික කලක් රුහුණෙහි ද වාසය කරමින් සේනාව ශක්තිමත් කළ බවයි. එය අනෙක් අතින් ඒ වන විට ලම්බකර්ණයින් රජරට බලයෙන් ආඪ්‍යව සිටි බව ද කියා පාන්නකි. කප්පලකණ්ඩ වශයෙන් හැඳින් වෙන (දැනට හඳුනාගෙන නැති) ස්ථානයකදී සේනාවන් දෙක අතර සටනක් ඇති විය. එය ද රජු පරාජයට පත්වන බව පෙනුණ ලම්බකර්ණයන් ශක්තිමත් කළ යුද්ධයක්ම විය. එහෙත් තම සේනාව පසුබසින බව පෙනුන විටදී රජුම සටනට වැද එම සටන ජයගත් බව මහාවංසයෙහි විස්තර වෙයි. (ම.ව.35ඃ36) කෙසේ වෙතත් මෙම විස්තරවලින් සනාථ වන්නේ ලම්බකර්ණයන් ඒ වන විට බලවත්ව සිටි තරමයි. මෙයින් රජු ලම්බකර්ණයන් විනාශ කිරීමට අදිටන් කරගත් අතර රජු තුළ ඔවුන් කෙරෙහි පැවැති කෝපය ද ප්‍රකාශ වන අස්ථාවක් ලෙසට ලම්බකර්ණයින්ගේ හිස් සිඳ රිය නැඹ උසට ගොඩ ගැසූ බව වංසකථාව වාර්තා කරයි. (ම.ව.36) පසුව අනුරාධපුරයට පැමිණ රජ වූ ඉලනාග රජතුමා ලම්බකර්ණයන්ගෙන් පලිගැනීම පිණිස ඔවුන් සියල්ලන් මැරීමට අදිටන් කරගත් බව වංශකථාව තවදුරටත් වාර්තා කරයි. එහෙත් සිය මව් බිසවගේ උපදෙස් පරිදි ඔවුන් විසින් අදිනු ලැබූ රථයෙන් නුවරට පැමිණ ඔවුන්ගේ නාසා පා ඇඟිලි කපා දමූ බවද සඳහන් වේ. (ම.ව.35ඃ44, පරණවිතාන එස්.1964ඃ172) මෙයින් ප්‍රකටව පෙනෙන කාරණ වන්නේ ඒ වන විට ලම්බකර්ණ වංශිකයන් රජයේ බොහෝ ඉහළ තනතුරු දරූ බවත් ඔවුන් විනාශකොට දමා රාජ්‍යය පවත්වාගෙන යාම බොහෝ අපහසු කාර්‍යයක් වශයෙන් තිබූ බවත් ය. ඔවුන් සියල්ලන් මරාදමා රාජ්‍ය පවත්වාගෙන යාමට අපහසු වන තරමටම ඔවුන් විවිධ පලාත්වල සිටි බව ඉන් පසක් වේ.

ලම්බකර්ණ වංසිකයන් බෝධි ආගමනයත් සමගම මෙරටට පැමිණි පිරිසෙන් පැවතෙන්නන් බවට ගෙන එන මතයට ද ඇතැම්හු විරුද්ධ වෙති. ඔවුන් පැවත එන්නේ පණ්ඩුකාභය රාජ පරම්පරාවෙන් බවට ද අදහස් ඉදිරිපත් වී තිබේ. මෙම මතය ගෙන එන දි.වි.රිචර්ඩ් ද සිල්වා ලම්බකර්ණයන් පණ්ඩුකාභය රාජ පරම්පරාවෙන් පැවැත එන පිරිසක් බවට අදහස් දක්වයි. (සිල්වා.දි.වි.1995:33) ඔහු මෙම මතයට එළඹෙනුයේ පස්වන දප්ජුල රජුගේ කතරගම පුවරු ලිපියේ පෙනෙන වදනක් පාදක කොටගෙනයි. එහි "ලමැණි මිහින්දහු විසින්" වශයෙන් සටහනක් වී තිබේ. (E.Z.Vol.III:223) ඒ අනුව ඊට අර්ථ සපයන පරණවිතාන ද පස්වන (05) දප්පුල රජු සිය පරම්පරාව ලමැණි රාජ පරම්පරාවෙන් පැවත එන බවට අදහස් දක්වන බවත්, එසේම දප්පුල රජු පණ්ඩුකාභය රාජ පරම්පරාවට නෑකම් කියන බැවින් බෝධි ආගමනය හා ආ පිරිස් හා ලම්බකර්ණයින් අතර සම්බන්ධතාවයක් තිබෙන බවට ඇති මතය සැක සහිත බව කියයි. (E.Z.Vol. III:123) මේ නිසා "ලම්බකර්ණ" යනු "නාග" හෙවත් "ගජ" යන අරුත්හි වටෙන බව දි.වි. රිචර්ඩ් ද සිල්වා පෙන්වා දෙයි. (සිල්වා.දි.වි.1995:34) ඒ කෙසේ වෙතත් එයින් සනාථ වන්නේ ලම්බකර්ණයන්ට ඍජුව හෝ වක්‍රව රාජ්‍යත්වය සඳහා උරුමයක් පැවති බවයි. ඍජුව වශයෙන් මෙහි දක්වන ලද්දේ පණ්ඩුකාභය රාජ පරම්පරාවට අයත් බව පිළිග නිතොත් ඍජු රාජ උරුමයක් ඔවුන් වෙත වේ. බෝධි ආගමනය හා පැමිණි පිරිස් හා සම්බන්ධතාවයක් පිළිගතතොත් ඒද වක්‍රව හෝ රාජ උරුමයට ඔවුන්ට හිමිකමක් ඇති බව කියා පාන්නකි. මේ නිසා රාජ්‍යපාලන කටයුතුවල ප්‍රමුඛව සිටි ලම්බකර්ණයන් කලයල් බලා සිය බලය ගැනීමට ගත් උත්සහයක් ඉලනාග රජු හා සම්බන්ධ යුද්ධ හා පුවත්වලින් සනාථ වන බව පැහැදිලි කරගත හැකිය.

ලම්බකර්ණ රාජවංශය පිළිබඳව විග්‍රහයක යෙදෙන ඒ. එස්. හෙට්ටිආරච්චි සඳහන් කරන්නේ පරණවිතානයන් දැක්වූ ලෙස ලම්බකර්ණයන් බෝධිය වඩමවන අවස්ථාවේ මෙහි පැමිණි අටලොස් කුලයට අයිති ලෙස සැලකිය හැකි බවයි. තවද ඔවුන් සැම ලංකා රාජ්‍ය විචාරීමට සුදුස්සන් සේ මෙරට වංශකථා කරුවන් සැලකූ බව ද ඔහු කිය යි. (හෙට්ටිආරාච්චි ඒ.එස්.1990:60) දඹදෙණියේ රජ පරපුරට අයත් තෙවන විජයබාහු රජු බෝධිය වැඩමවාගෙන ආ නැම්බඹර සෝම රාජ පරපුරට අයත් වන බවත්, කුරුණෑගල රජ වූ පස්වන ජයබාහු රජ බෝධිය සමඟ ආ සවුළු රාජවංසයට අයත් වන බවත් ලංකාවේ විජය රාජ වංශය අවසන් කරන ලද්දේ බෝධිය සමඟ ආ බලත් කුලයේ සුභ නම් බලතා විසින් බවත් එතුමා පෙන්වා දෙයි (එම). මීට අමතරව සිතුල් පව්වෙන් ලත් එක් ගෙවී ගිය ශිලා ලේඛනයකට අනුව වසභ රජුගේ මුතුන්මිත්තන් ඉතා ඈත අතීතයේ සිට පාලන කටයුතුවලට සම්බන්ධව සිටි බව එතුමා කියයි. ඒ බව සනාථ වන්නේ එම සෙල්ලිපියේ "සිධ.....මහරජහ මරුම(කන කහ) (උ)වරජ තිසහ" යන වදන පදනම් කරගෙ නයි. (හෙට්ටිආරාච්චි ඒ.එස්.1990:60) මෙම ශිලාලිපිය වසභ රජුගේයැ යි පරණවිතාන තීරණය කොට ඇත්තේ මහාවංශයේ පෙනෙන විස්තරයකට අනුවය. ඒ අනුව වසභ රජු ථූප දහයක් සිතුල් පව්වෙහි කරවා තිබේ. (ම.ව.35:18) මෙයින් පෙනී යන්නේ වසභ රජුගේ පරම්පරාවට මෙරටෙහි රාජ්‍යත්වය සඳහා හිමිකාරත්වයක් පැවති බවයි.

කෙසේ වෙතත් ලම්බකරණ වංශිකයන් පිළිබඳව පශ්චාත් ඉතිහාස කතා හා වංශකථාවල පෙනෙන තොරතුරු වලින් බැලුවහොත් වංශය පිළිබඳ යම් යම් තොරතුරු අනාවරණය වීම මෙහිදී විමසිලිමත් විය යුතු තත්ත්වයකි. දීපවංසයෙහි සංඝතිස්ස රාජ්‍යොදය පිළිබඳ ව කරුණු සඳහන් කරමින් "සංඝබෝධීති නාමෙන රාජා ආසි

සුසීලවා, ද්වේ වස්සානෙ ව සො රාජා රජ්ජං කාරෙසි ඛත්තියො" වශයෙන් දක්වා තිබේ. (දී.ව.25:51) එහෙත් සමහර පිටපතක සඳහන් ඇත්තේ මෙම ගාථාවේ දෙවන පදය "අනුරාධපුරෙ රජ්ජං දෙව වස්සානෙව කාරයි" වශයෙනි. මෙහි මුල් දක් වූ පදාර්ථය ගන්නේ නම් "සො රාජා රජ්ජං කාරෙසි ඛත්තියො" වශයෙන් සටහන් වී තිබීම නිසා "ක්ෂත්‍රික වංශික ඒ රජු රාජ්‍ය කළේය" වශයෙන් අර්ථ කිව යුතු වේ. ඒ අනුව සංඝබෝධි රජු ක්ෂත්‍රිය රාජ පරම්පරාවට අයත් වන බව පැහැදිලිව කියවේ.

ලම්බකර්ණ යනු එල්ලෙන කන් ඇත්තන් බවත් ඔවුන් සමහර විට ද්‍රවිඩ පාලකයින් විය හැකි බවත් ක්‍රිෂ්ණ රාමසාමි අයියාන්ගර් සඳහන් කරයි. තව ද එම නාමය ඔවුනට හිමි වූයේ ඔවුන්ගේ කන එල්ලෙන හිසද නොඑසේ නැතිනම් විශාල ප්‍රමාණයේ කර්ණාභරණ පැළඳ සිටි නිසා කන්වල සිදුරු මහත් ව තිබූ නිසාදැ යි පැහැදිලි නොවන බව ඔහු කියයි. ලංකාවේ මෙන්ම පාණ්ඩ්‍ය රටෙහි ද මෙකී ලම්බකරණයන් පාලන කාර්යයෙහිදී වටිනා කාර්යභාරයක් ඉටු කළ බව ඔහු කියයි. ඔවුන්ට රාජකීය මෞලි මංගල්‍යයේ දී ඉතා ප්‍රධාන වගකීමක් හිමිව තිබූ බවත් ඔහු වැඩිදුරටත් පෙන්වා දෙයි. තව ද ඔවුන් අනුරාධපුර රාජධානියෙහි සෙන්පතිධුර දැරූ බවත්, රාජ්‍යයත්වය පැහැර ගැනීමේ දී එකී සෙන්පතිධුර දැරූවන් ප්‍රධානතම කාර්යභාරයක් ඉටු කළ බවත් ඔහු කියයි. (Krishnaswami Aiyagangar: 1923:86/87)

හේම එල්ලාවල, ලම්බකරණයින්ගේ ගෝත්‍ර සලකුණු නාමය වන ලක්ෂ්මන් යන්න මෙරටට ඔවුන් පැමිණෙන විට රැගෙන එන්නට ඇති බවත්, ඔවුන් ඡිද්‍ර කර්ණයින් වූ නිසා ලම්භකරණ යන නමින් හැඳින්වී එය ලමැණි නම් වූ බවත් ලක්ෂ්මන් යන්න හින්න වී ලමැණි වූ බවත් පවසයි. (එල්ලාවල එච්.1964:32)

මේ පිළිබඳව විග්‍රහයක් කරන ප්‍රසාද් ෆොන්සේකාගේ මතය වන්නේ ලම්බකරණ යනු එල්ලා වැටෙන කන් ඇත්තවුන් හැඳින්වීමට යෙදූ වදනක් බවයි. බරැති කන් අබරණ පැළඳී නිසා ඔවුන් එනමින් හැඳින් වූ බවත් ඔහු කියයි (ෆොන්සේකා පී.2001:66). මේ සඳහා සාධක වශයෙන් ඔහු බුදුරජාණන් වහන්සේගේ කන් සියලු ප්‍රතිමාවල අතීතයේ සිටම එල්ලා වැටෙන කන් ඇතිව ම නිර්මාණය කොට තිබෙන බවත් ඒ නිසා ලම්බකරණයන් ශාක්‍ය රාජ වංශයට අයත් වන බවත් දක්වයි (එම). තව ද ලම්බකරණයන් යනු ශාක්‍යවරුන් හා මයුර ශාක්‍යවරුන් එක්ව සැදූ වංශය වශයෙන් ද ඔහු හඳුන්වා දී තිබේ (එම).

සද්ධර්මරත්නාකරයෙහි දැක්වෙන්නේ ලම්බකරණ යනු බෝධිආගමනය හා පැමිණි අටළොස් කුලයන්ගෙන් එක් කුලයක් බවයි. පසුව වර්ධනයව ගිය එම කුලය ගණවැසි වංශ වශයෙන් හඳුන්වන ලද බවත් උභයකුල පාරිශුද්ධ අලාමක වූ බැවින් හා ලම්බකර්ණව පැවත ආ හෙයින් ලමැණිවංශය යි කියා ප්‍රසිද්ධ වූ බවත් එහි දැක්වේ (ස.ර.ක.1923:296).

ලම්භකරණයන් පිළිබඳව පළමුවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයට අයත් ව තවත් අවස්ථා දෙකකදී විස්තර සටහන් වේ. ඒ අනුව පරාක්‍රමබාහු මහ රජතුමා විසින් ඉදිකරන ලද දළදා මාළිගයෙහි විවිධ ආරක්ෂක හා වගකිවයුතු රාජකාරිවල ලම්බකරණයන් යොදන ලද බවත් එහි සටහන්ව තිබේ. ඒ අනුව එකී දළදා මාළිගාවේ ඡත්‍ර, චාමර, ශංකාදීය ගත් අත් ඇති ලම්භකර්ණයන් හා අන්‍යවූ මහා කුලවතුන් ද යොදා ආරක්ෂක හෝ ගෞරවණීය රාජකාරිවල ලම්භකර්ණයන් යොදනු ලැබ ඇත. (ම.ව.74.215) පසුව

වීරපඬි කුමාරයාහට ඔටුණු පැළඳවීමේ මංගලෝත්සවයේදී ද ලම්හකර්ණයන්ට විශේෂ රාජකාරි භාරව තිබූ බව මහාවංශයෙහි සටහන්ව තිබේ.

"මාලව, චක්‍රවර්තීව, මාද්‍රවරායරය, ඵලයරුනඩාල්වය යන මේ ලම්බකර්ණ ගෝත්‍ර ඇත්තවුන් ලම්හකර්ණ ධූරවකරණයට මෙහෙයා" වශයෙන් එහි සටහන්ව තිබේ. (ම.ව.77:28) මෙයින් ලම්බකර්ණයින් ඉහත දැක්වූ මාලව, චක්‍රවර්තී, මාලවරායර, ඵලයුර, නඩාල්වය යන මේ ලම්බකර්ණ ගෝත්‍ර ඇත්තවුන් එම ලම්බකර්ණ ධූරාවලියට අයත් වන බව දක්වා තිබේ. එසේ ගත් විට දක්ෂිණ භාරතීය ක්ෂත්‍රිය ගෝත්‍රිකයන් අතරට ඔවුන් ද අයත් වන බව සිතීමට අවකාශ හිමිවේ. දොළොස්වැනි (12) සියවසට අයත් ශිලාලේඛනයක ලම්බකර්ණයන්ට අයත් රටක් පිළිබඳව කරුණු සටහන් වේ. එහි ලාල, බර්වාර, පරස, නේපාල, වැනි රාජ්‍යයන් ද ඒකපාද ලම්බකර්ණ යනු ද එවැනි රාජ්‍යයන් බව එහි සටහන්ව තිබේ. (E.C.Vol.VII:158)

මේ සම්බන්ධව හේම එල්ලාවලගේ මතය වන්නේ ලම්බකර්ණ, ගණවැසි හා මෙහෙණවර යන අංශ තුනම ක්ෂත්‍රිය කුලයට අයත් නොවන බවත් ඔවුන් වෛශ්‍ය කුලයට අයත් වන බවත් ය. මේ සඳහා ඔහු බොහෝ විට පාදක කොට ගෙන ඇත්තේ ජන විශ්වාසයයි. (එල්ලාවල එච්.1964:33-34) එහෙත් මෙරට රාජ්‍ය පාලනයට ද ඔවුන් වරින් වර පැමිණ දීර්ඝ කාලයක් රාජ්‍ය විචාරීම සිදු කොට ඇති බැවින් ද දක්ෂිණ භාරතීය විවිධ පාලන ප්‍රදේශවල ද ඔවුන්ගේ පාලනය පැවති බව සනාථ වන බැවින්ද දීපවංශයේ "ඛත්තිය" හෙවත් ක්ෂත්‍රිය යන කුලයකට අයත් වන බවට සනාථ කොට ඇති බැවින් ද ඔවුන් වෛශ්‍ය කුලයට නොව ක්ෂත්‍රිය රාජ කුලයට අයත්ව පැවත එන්නන් වශයෙන් සකාරණව සනාථ වන බැවින් එසේ ගැනීම යුක්ති යුක්ත බව සටහන් කළ හැකිය.

දෙවන ලම්බකර්ණ රාජ වංශයේ ප්‍රමුඛයා වූ මානවම්ම රජුගේ (ක්‍රි.ව.684-718) වංශය මහා වංශයෙහි සටහන් කොට ඇත්තේ මහා සම්මත රාජ වංශයෙහි උපන් කාශ්‍යප නම් රජුගේ පුත්‍රයා ලෙසයි. (ම.ව.45:243) එයින් එම රජුට රාජ්‍යත්වය සඳහා උරුමයක් ඇති බවට හේතු දක්වා තිබේ. සිරිසංඝබෝධි රාජකුමාරයාගේ උත්පත්තිය හා වංශ පරම්පරාදිය පිළිබඳව ද සඳහන් කරන හත්ථවනගල්ල විහාරවංශය එම රජු සේලාභය නම් ක්ෂත්‍රිය අංශයට අයත් මහියංගණ විහාරය අවට ගෝත්‍රයක සිටි ගම් ප්‍රධානියකුගේ පුතෙක් ලෙස දක්වා ඇත (එ.අ.ව.1955:06). සංඝතිස්ස හා ගෝඨාභය යන රාජ කුමාරවරුන් දෙදෙනා පිළිබඳව එම ග්‍රන්ථයේ දක්වන්නෙ "ලමැණි පක්ෂයෙහි වූ අභිකුදු රාජ කුමාරවරු දෙදෙනෙක් වැලි කෙළියේ පටන් යහළු වූ ඉෂ්ට මිත්‍රවරු" වශයෙනි. ඔවුන් ද සංඝබෝධි කුමාරයා හා අනුරාධපුරයට පැමිණෙන්නේ ඒ මිත්‍ර කම නිසා ය (එම:19).

සද්ධර්මරත්නාකරයෙහි දැක්වෙන්නේ ශාක්‍ය රජ දුහිතෘ වූ වේඨිය දේවීන් ධර්මාශෝක මහරජුගේ අගමෙහෙසුන් කොට ගත් බවත්, ඇයගේ මලණුවන් වූ සූර්යරාජවංශෝත්භූත රජකුමරුවන් අට දෙනා හා සුමිත්‍ර බෝධිගුත්ත යන රාජ කුමාරවරුන් දෙදෙනා යන දස දෙනා ම ධර්මාශෝක රජුට සම වූ බවත් ඒ අය සමඟ සංඝමිත්‍රා භික්ෂුණිය ද බෝධිය ද ලංකාවට එවූ බවත්, එම පරම්පරාව ගණවැසි ව විශාලව ගිය බවත්, එබැවින් ගණවැසිවංශ නමින් හැඳින්වූ බවත් සද්ධර්මරත්නාකරය දක්වා තිබේ. තව ද ලම්බකර්ණව ආ හෙයින් ලමැණිවංශයැ යි කියා නම් ලද බව ද එහි දක්වා තිබේ (ස.ර.ක.:296).

ඉලනාග රජු ඇවෑමෙන් රාජ්‍යත්වයට පත්වන්නේ එම රජුපුත් චන්ද්‍රමුඛසිව යි. එම රජු විවාහ ගිවිස ගත්තේ ද්‍රවිඩ කුමාරිකාවක සමග ය. එම දේවිය දමිළ දේවි වශයෙන් මහාවංසයේ හඳුන්වා දෙයි. (ම.වංශ35:48) එහෙත් එම නාමය දේවියගේ නියම නාමය නො වූ බව පෙනේ. කෙසේ වෙත් ඉලනාග රජු ඉන්දියාවෙන් යුද ආධාර ලබාගැනීම පිළිබඳ පුවත හා මෙම දේවියගේ සම්බන්ධයක් තිබේ. රජු ද්‍රවිඩ රජකුගෙන් යුද ආධාර ලබා ගන්නට ඇත. ඒ නිසා ද්‍රවිඩ කුමාරිකාවක සරණපාවා ගන්නට සිදු වන්නට ඇතැ යි විශ්වාස කළ හැකිය. පරණවිතාන ද එය වන්දියක් විය හැකි බවට අදහස් පළ කරයි. (පරණවිතාන එස්.1964:172) දීපවංශය ද ඔහු චන්ද්‍රමුඛසිව රජුගේ රාජපදප්‍රාප්තිය ද ද්‍රවිඩ දේවියක සරණ පාවා ගැනීම පිළිබඳව ද කරුණු දක්වා තිබේ. ඉසුරුමුණි විහාරයට මණිකාරාම විහාරය වශයෙන් විහාරයක් පිදූ බව ද දීපවංශය වාර්තා කරයි (දී.ව.21:43). මෙම මණිකාරාම විහාරය මෙතෙක් හඳුනාගෙන නොමැතිමුත් එය වෙහෙරගොඩයාය මනි විහාරය වශයෙන් තත් විහාරස්ථානයේ ශිලාලේඛන ආශ්‍රයෙන් නූතනයේ හඳුනාගෙන තිබේ. (විමලඛන්ති හිමි ජී.2020:) කෙසේ වෙතත් ලම්බකර්ණ වංශිකයන් හා ඉලනාග රාජ යුගයේ පැවති සටන් චන්ද්‍රමුඛසිව රාජ්‍ය අවධියේ දී වංශකථාදියෙහි වාර්තා නොවෙයි. අනතුරුව චන්‍ද්‍රමුඛසිව රජු මරා ඔහු මළණුවන් වූ යසලාලකතිස්ස කුමරු රාජ්‍යයට පත් වූ බව මහාවංසයෙහි දක්වා තිබේ (ම.ව.35:49).

යසලාලකතිස්ස රජු වංසකථාදියෙහි හඳුන්වා ඇත්තේ විහිළුකාර චරිතයක් ඇත්තකු ලෙය සි. තම ජ්‍යෙෂ්ඨ සොහොයුරා තිසා වැවේ දිය කෙළියේ දී මරා රජ වූ රජකු ලෙසත් අවුරුදු හතකුත් මාස අටක් එම රජු රාජ්‍ය විචාළ බවත් මහාවංසය වාර්ථා කරයි (ම.ව.35-50-51). එසේම දත්ත නම් දොරටු පාලකයාගේ පුත් සහ දොරටුපාල කාර්යයෙහි යෙදී සිටි බවත්, රූපකායෙන් සමාන වූ නිසා දෙදෙනා කෙළියට තනතුරු මාරු කරගෙන රාජ්‍ය විචාළ බවත් මහාවංසයෙහි එයි. මෙය විකට කථාවකි. එහි ප්‍රතිඵලයක් ලෙස සුබ නම් දොරටු පාලයා වසර හතක් රාජ්‍ය විචාළ බව ද වංශකථාවෙහි දක්වා තිබේ (එම:57). එහෙත් එම විකට කථාව හුදු ප්‍රලාපයක් නොවිය හැකි බව පරණවිතානයන් ද පිළිගනී (පරණවිතාන එස්.1964:173). මෙම විකට කථා වස්තුව හුදෙක් ලම්බකර්ණයන් රාජ්‍ය බලය ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ක්‍රියාදාමයක ප්‍රතිඵලදායි අතුරු ඵලයක් ලෙස සැලකිය හැකිය.

මෙලෙස රාජ්‍ය පද ප්‍රාප්තිය සනිටුහන් කිරීම පිළිබඳ විවිධ කථාවස්තු විවිධ රටවල ඉතිහාසය පුරා වාර්තා වී තිබේ. ඒ අතර බැබිලොනියාවෙන් වාර්තාවන පුවතකට අනුව රජුගේ රාජ්‍ය පාලන යුගය අවසන් වූ පසු රජු හා ප්‍රධාන නිලධාරීන් යටහත් සේවකයන් වී සේවකයින් හාම්පුතුන් වන රාජ්‍ය පාලන බලය හුවමාරු කරන ක්‍රමයක් එහි විස්තර වේ. මේ අවස්ථාවේදී සිරකරුවෙක් රජුගේ සිංහාසන ප්‍රාප්ත කරනු ලැබේ. රජුගේ ඇඳුම් හා ඔටුන්න ද ඔහුට පිරිනමනු ලබන අතර දින පහකින් පසුව ඔහුව මරා දමනු ලැබේ. එම කාලය තුළ ඔහුට රජුට අයත් සියලු සැප සම්පත් හා බලය භාවිත කළ හැකි අතර රාජසුව විඳගැනීමට ද අවස්ථාව සැලසේ. මෙහි ඇති වටිනාම අවස්ථාව වන්නේ එම කෙටි කාලය තුළ ඔහුට කැමැති ඕනෑම විධානයක් නිකුත් කළ හැකි වීමයි. ඒ සියළු විධාන ඉටු කළ යුතු ද බලාත්මක ද වේ. (Frazer G.J.1925:282) සුභ නම් දොරටු පාලයා ද තමා වෙත ආ අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන නියෝගයක් නිකුත් කළේය. එ අවිචාරවත් ව හැසිරෙන දොරටුපාලයා අල්වා හිස ගසා දමන ලෙයසි. එවිට රාජ්‍ය පිළිබඳ සියලු විධාන සිය ජීවිතය තිබෙන තෙක් ඔහුට නිකුත් කිරීමේ අවස්ථාව උදා විය.

කෙසේ වෙතත් අභිලේඛන මූලාශ්‍රයයන් පාදක කරගෙන සභ රජු ප්‍රධාන අමාත්‍ය තනතුරු දැරූ රාජ්‍ය පාලක පරම්පරාවකින් පැවත එන්නෙක් වශයෙන් ද හඳුනා ගැනීමට ප්‍රමාණවත් සාධක තිබේ. මේ යටතේ කඳුරුවැව ශිලාලේඛන යටතේ එන නාගහමුල ගල්ගේ ශිලාලේඛනයෙහි පරම්පරා හතරක තොරතුරු සභ රජු සම්බන්ධයෙන් ඇති බවට පරණවිතානයන් ගෙනහැර දක්වයි (EZ Vol. V; 1965:416-418). එහි දැක්වෙන ආකාරයට ''දෙවනපි තිස මහරජහ(න) වසිටි නම මහ අමෙතිය පුතෙ පරුමක තිස නම පුතෙ පරුමක වහිති මඩෙ නම එත අමෙතහ පුතෙ පරුමක කණපෙටික තිස නම එත අමෙත පුතෙ පරුමක දත අමෙත නම මහනක රජහ මහදොරතන පටිවිත දිනෙ...'' (ibid:412). මෙහි පරම්පරා හතරක නම් කියවේ. එයින් පළමුවැන්නා දෙවනපිය තිස මහරජුගේ වසිටි නම් මහඇමතියාගේ පුත්‍රයා පරුමක තිස නම් වේ. පරුමක තිසගේ පුත් වූයේ පරුමක වහිති වඩෙ නම් වේ. එම අමාත්‍යයාගේ පුත්‍ර වූයේ පරුමක කණපෙටික තිස නම් වේ. ඒ අමාත්‍යයාගේ පුත්‍ර වූයේ පරුමක දත නම් වූ අමාත්‍යවරයා ය. ඔහු මහනක රජුගේ මහාද්වාරපාලක තනතුර දරන ලද්දේ ය. මෙහි දෙවනපිය තිස නම් වූ රජු පරණවිතානයන් හඳුනාගෙන ඇත්තේ කඳුරුවැව අට වැනි (08) එකොළොස්වැනි (11) හා පසළොස්වැනි (15) යන ශිලාලේඛනයන් සියල්ලම ඇසුරු කරගෙන යි.

එහි අටවැනි ශිලාලේඛනයෙහි මෙසේ සඳහන් වෙයි. ''පරුමක වහිති මතහ මරුමනකහ කණපෙඩික පරුමක තිසහ පුතහ පරුමක දතහ'' (ibid:410). මෙහි සඳහන්වෙන පරම්පරා සටහනට අනුව අමාත්‍යවරයෙකු වූ (වාර්තා තබන්නා) වාසිෂ්ඨ (වහිටි)ගේ මුණුබුරා වූයේ කණපෙඩික පරුමක තිස්ස යි. ඔහුගේ පුත්‍රයා වූයේ පරුමක දත්ත යි. එයින් මෙහි පසලොස්වැනි ශිලාලේඛනයේ කියවෙන කණපෙටික සිස්ස පිළිබඳව කියවෙයි.

එම ස්ථානයේ ම ඇති එකොළොස්වෙනි ශිලාලේඛනයෙහි මෙකී පරම්පරා සටහන තවදුරටත් විස්තර කෙරෙන ප්‍රකාශයක් අඩංගු වෙයි. ''පරුමක වහිඩි මතහ මරුමකනකෙ දොරකණි රුපවාපර හාමිකහ ජෙට පුතෙ ගොපහ'' එයින් අමාත්‍යවරයෙකුවූ වහිඩිගේ මුණුබුරෙකු වූ කෝෂ්ඨාධිකාරී දෝවාරික හෙවත් ද්වාරපාලක වූ හාමිකරගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර වූ ගෝප වශයෙන් එම පරපුරු නාමයන් දැක්විය හැකි ය. මේ තොරතුරු ආශ්‍රයෙන් පරණවිතානයන් පරම්පරා සටහනක් ද මේ වෙනුවෙන් නිර්මාණය කොට තිබේ. එහි වසිටි මහා අමාත්‍යවරයාගේ පුත්‍රයින් දෙනෙනෙක් මේ ශිලාලේඛන තුනෙන් ප්‍රකාශයට පත් වේ. ඒ පරුමක තිස්ස හා වහිටි මඩෙ යන දෙදෙනා යි. එයින් වහිටි මඩෙගේ පුත්‍රයින් දෙදෙනෙක් මේ ශිලාලේඛනවලින් කියවෙයි. ඒ කණපෙඩික තිස්ස හා හාමික යන දෙදෙනා යි. මෙයින් හාමික ද්වාරපාලක ධුරය ද දරා ඇත. මෙයින් කණපෙඩික තිස්සගේ පුත්‍රයෙක් වශයෙන් පරුමක දත්ත හඳුනාගත හැකි වන අතර ඔහු ප්‍රධාන ද්වාරපාලකයෙකු වේ. තව ද ද්වාරපාලකයෙකු ම වූ හාමිකගේ පුත්‍රයා ගෝප නම් වේ (ibid:417). මෙම තොරතුරු පදනම් කරගෙන සභ රජු පිළිබඳව යම් පැහැදිලි විස්තරයක් ගොඩනගා ගත හැකි ය.

මහාවංශයේ සභ රජු පිළිබඳව සටහන් කර ඇත්තේ දත්තනම් ද්වාර පාලකයාගේ පුත්‍ර වූ ද්වාරපාලක සුභ රූප ශෝභාවෙන් යසලාලක තිස්ස රජුට සමාන වන බව යි (ම.ව.35:51). කඳුරුවැව ඉහත දක්වන ලද ශිලාලේඛනවලින් ද ප්‍රකට වන්නේ පරුමක දත්ත නම් ප්‍රධාන ද්වාරපාලකයා මහාවංශයෙහි දැක්වූ ද්වාරපාලක සභගේ පියා වූ ද්වාරපාලක දත්තම වන බව යි. ඒ අනුව දත්තගේ ද්වාරපාලක ධුරය අනතුරුව දරන

ලද්දේ සහ නම් වූ ද්වාරපාලකයා විසිනි. එය උක්ත ශිලාලේඛන හා වංශකථාගත විස්තරය හා ද ගැලපේ. ඒ අනුව වසභ රජු විසින් සහ රජු මරා රාජ්‍යත්වයට පත්වන බව ද මහාවංශයෙහි ම පැහැදිලි කොට තිබේ (එම:68). විහාරේගල පළමු ගිරි ලිපියෙහි සහ රජතුමා ''සබරජෙ'' වශයෙන් ම තමන්ව හඳුන්වා දී ඇත. (EZ Vol. III; 1933:165) එය මහාවංශයෙහි සහ රජු හැඳින්වූ නාමයට සර්වප්‍රකාරයෙන්ම ගැලපේ. ඒ අනුව මේ තොරතුරු වලින් පැහැදිලි වන්නේ කඳුරුවැව ශිලාලේඛන අතර පසළොස්වැනි ශිලාලේඛනයෙන් පැහැදිලිවන ආකාරයට එහි සඳහන් තිස මහරජු ලඤ්ජිතිස්ස මහරජු ලෙසත් (ක්‍රි.ව.119-109), මහනක රජු මහාදාඨික මහානාග (ක්‍රි.ව.07-19) රජු ලෙසත් හඳුනාගත හැකි ය. එසේම දෝවාරික දත්ත සහ රජුගේ පියාවූ දෝවාරික දත්ත ලෙසත් හඳුනා ගත හැකි ය. මේ තොරතුරුවලින් සනාථ වන්නේ සහ රජුගේ වංශය මහරජුන් යටතේ සේවය කළ මහඇමති තනතුරු දැරූ පරම්පරාවකින් පැවත එන බවත්, ඔවුන් ප්‍රධාන ද්වාරපාලක ධුරය දැරූ පිරිසක් වශයෙනුත් හඳුනා ගත හැකි ය. තව ද ඔවුන් රජයේ ප්‍රධාන ඇමති තනතුරු දැරූ පිරිසක් වශයෙන් ද ක්‍රියා කොට තිබෙන බව මෙයින් පැහැදිලි වේ.

කෙසේ වෙතත් උක්ත මහාවංශාගත විකට කථාව ද එබඳු ක්‍රමවේදයක් වූයේ ද යනු පැහැදිලි නොමැත. එහෙත් ලම්බකර්ණයන් රාජ්‍ය බලය අල්ලා ගැනීම සඳහා දියත් කළ ජවනිකාවක ප්‍රතිඵලයක් ද යනු පැහැදිලි නොවේ. කෙසේ වෙතත් සුභ රජු පාලනයෙහි අදක්ෂයෙක් නොවීය. ඔහු පිළිබඳ ශිලා ලේඛන ද හමුවී ඇති බැවින් හා ආර්ථික හා ආගමික අභිවෘද්ධිය වෙනුවෙන් ඔහු කළ කී දෑ ද වංශකථාවෙහි ඇගයීමට ලක් කරයි. එසේම වසභ රජුගේ පුත් එම රජුගේ අනුප්‍රාප්තික වංකනාසිකතිස්ස රජුගේ බිරිය සහ රජුගේ දියණියක වන බැවින් එම රජු ද ලම්බකර්ණයෙකැ යි සැලකීමට හැකියාවක් පවතී. (ලං.වි.ලං.ඉ.පරපුර සටහන, රණවැල්ල සිරිමල් 2000:101) එසේ විශ්වාස කරන්නේ නම් ලම්බකර්ණ රාජ වංශය පළමුවෙන් බලයට පත්කරන ලද්දේ වසභ රජු නොව සහ රජු වශයෙන් පිළිගැනීමට සිදු වේ. කෙසේ වෙතත් ඉලනාග රාජ යුගයේ පුපුරා ගිය මෞර්ය ලම්බකර්ණ ගැටුම සහ රාජ්‍ය යුගයේදී ලම්බකර්ණයන් බලයට පත්වීමත් සමගම අවසන් වූ බව පිළිගැනීමට සිදුවේ. මහාවංශයෙහි විස්තර කරන ආකාරයට වසභ රජු පිළිබඳ පුවත් කාල්පනික කථා ආදියෙන් ඔප දමා තිබෙන බව පසක් වේ. නිමිත්ත පාඨකයින්ගේ දැනුම්දීම මත වසභ නමින් ලම්බකර්ණ රාජ වංශිකයෙක් සහ රජුන් මරා රාජ්‍යය පැහැර ගනු ලබන බව සහ රජු දැන ගත්තේය. එබැවින් එම නම ඇති සියල්ලන් මැරවීමට රජු අණ නිකුත් කරන ලදි (ම.ව.35:61). උක්ත නියෝගය නිකුත් වන අවස්ථාවේ දී වසභ නම් ලම්භකර්ණ වංශිකයෙක් සිය මළණුවන් වූ සෙන්පතියෙකුට උපස්ථාන කරමින් සිටියේය. රාජ නියෝගය අනුව එම වසභව සහ රජුට භාර දීමට ගෙන ගිය අතර සෙනෙවියන්ගේ බිරිඳ ඉදිරිපත්ව ඔහු බේරාගෙන සිය හෙයින් පිටකර හරින ලදි. නිමිත්ත පාඨකයින් ද මෙම තොරතුරු අතර ප්‍රධාන චරිතයක් රඟපානු පෙනේ. එක්තරා කුෂ්ඨ රෝගියෙක් වසභ රජ වන බව ප්‍රකාශ කිරීම එබඳු එක් සිදුවීමකි. කෙසේ වෙතත් රුහුණු රටින් සේනා සංවිධානය කොටගෙන වසර දෙකක් ඇවෑමෙන් වසභ අනුරාධපුරයෙහි රජ වූ බව වංශකථාව පැහැදිලි කරයි (ම.ව.35:69 පරණවිතාන එස්. 1964:175). කෙසේ වෙතත් ලම්බකර්ණ රාජ වංශිකයන් මෙරට රාජ්‍යය විචාරීම සඳහා උරුමකම් ලැබූ පිරිසක් වශයෙන් හඳුනා ගැනීමට මේ තොරතුරුවලින් අවස්ථාව උදා වේ.

## සමාලෝචනය

වසභ රජු පැහැදිලිව පෙණෙන ලම්බකර්ණ පරපුරේ පළමු රජු ලෙස සිංහාසන ප්‍රාප්ත වීම අභිලේඛන ආශ්‍රයෙන් කෙරෙන මෙම පර්යේෂණයේදී ප්‍රධාන කඩඉමක් වශයෙන් සලකනු ලැබේ. වංශකථාගත සාධකවලට අනුව ද එය එක්තරා ආකාරයක නව රාජ වංශයක ආරම්භය ද වේ. තව ද මෙරට ලේඛන කලාවෙහි අතිවිශාල දියුණුවක් වාරි තාක්ෂණ වේදය සඳහා නව්‍ය සීමාවක් සනිටුහන් කරන යුගයක් හා මෙරට ආර්ථිකය ද දියුණුවෙන් දියුණුවට ගිය ජනහිතකාමී යුගයක ආරම්භය ලෙස ද ලම්බකර්ණ රාජ වංශයේ ආරම්භය දැක්විය හැකිය. ඔවුන් මෙරට ජනයාගේ හිත සුව පිණිස කටයුතු කළ පිරිසක් බව ද ශාස්ත්‍රීය සේවාව හා බුදු සසුනේ අඛණ්ඩ පැවැත්ම උදෙසා ද මහත් මෙහෙවරක් කළ පිරිසක් ලෙස ද හඳුනා ගැනීමට හැකිව තිබේ. මේ නිසා වසභ රාජ යුගයේදී ආරම්භ වූ ලම්බකර්ණ නම් නව රාජ වංශයේ ඇරඹුම පැහැදිලිව ම මෙරට සමාජ සංස්කෘතික හා ආර්ථික රටාවෙහි හැරවුම් ලක්ෂයක් ලෙස සැලකීමට හැකියාව පවතින බව පැහැදිලි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අනුරාධපුර යුගය, අමරදාස ලියනගමගේ, රණවීර ගුණවර්ධන සංස්. (1965), ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ

අභිලේඛන, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සත සන්වත්සරය, (1990), නන්දදේව විජේසේකර ප්‍රධාන සංස්. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, කොළඹ

එල්ලාවල එච්. පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය, (1964), සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ

එළු අත්තනගලු වංසය, මකුළුදූවේ පියරතන ස්ථවිර සංස්. (1955) සී.ස. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ

නිකාය සංග්‍රහය හෙවත් සාසනාවතාරය, සයිමන්ද සිල්වා, ඒ. මෙන්ඩිස් ගුණසේකර, ඩබ්. එෆ්. ගුණවර්ධන, සිංහල පරි. (1922), රාජ්‍ය මුද්‍රණ සංස්ථාව, කොළඹ

දීපවංශය, කිරිඇල්ලේ ඤාණවිමල ස්වාමීන්ද්‍ර පරි. (1959), සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ

දීපවංශය, ප්‍රසාද් ෆොන්සේකා සංස්. (2019). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල මහාවංශය හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමි, බටුවත්තුඩාව පරි. (2012), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල

ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, සිංහල පරි. හේමචන්ද්‍ර රාය ප්‍රධාන සංස්. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ සිංහල පරිවර්තනය, (1964), විශ්වවිද්‍යාල ප්‍රකාශනය

වංසත්ථප්පකාසිනී, මහාවංශ ටීකාව, අකුරටියේ අමරවංස නාහිමි, හේමචන්ද්‍ර දිසානායක සිංහල පරි. (2001), එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ

විමලඛන්ති හිමි ජී. වෙහෙරගොඩයාය අප්‍රකාශිත ගිරි ලිපිය, (2020) මුද්‍රණයේ

සද්ධර්මරත්නාකරය, සුගුණසාර හිමි කොළොන්නාවේ හිමි සංස්. (1923) ඩී.සී. වික්‍රමසිංහ අප්පුහාමි හා ඩී.ර්. වික්‍රමසිංහ, විද්‍යාර්ථප්‍රකාශ යන්ත්‍රාලය

සිල්වා දි.වි., ලමැණි රජ කුලය, (1995), මහ සවිය සුභ සාධක පදනම, පහන් පහරුව, කොළඹ, ෆොන්සේකා ප්‍රසාද්, ශ්‍රී ලංකාවේ රාජ වර්ෂ, (2001), අමුද්‍රිත ග්‍රන්ථය

ශ්‍රී ලංකාවේ ඉතිහාසය, අනුරාධපුර යුගය, පළමු වන කොටස, (2000) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ

Epigraphia Zeylanica, Vol. III, Wikramasinghe don Matino De Silva ed. (1934), Published for the Government of Ceylon by Humphrey Milford, Oxford University Press, London

Epigraphia Zeylanica, Vol. V, Paranavitana S, Godakumbura C.E.. (1965), Published Archaeological Department, Ceylon Colombo.

Epigraphia Curnatica, Vol. VIII, (1902), B. Lewis Rice, Mysore Government Press, Bangalore

Frazer Sir James George, The Golden Bough (A study in Magic and Religion), (1925), The Macmillan Company, New York

Krishnaswami Aiyangar S., Some Contribution South India to Indian Culture, (1923), University of Culcutta, Culcutta